

# ගිවිසුම් නීතිය

part 02



## වලංගු ගිවිසුමක මූලික අවශ්‍යතා

- පාර්ශවයන් අතර එකගතාව
- ප්‍රතිෂ්ඨාව
- නෛතික සබදතාවයක් ඇති කර ගැනීමේ චේතනාව
- ගිවිසුමක ශක්‍යතාවය

# ප්‍රතිෂ්ඨාව

පුද්ගලයෙකු විසින් ගිවිසුමක් ඇති කරගැනීමේදී දෙනු ලබන පොරොන්දුවක් සඳහා ලබාදෙන්නා වූ යම් වටිනාකමක්.




## වලංගු ගිවිසුමක අත්‍යවශ්‍ය කොටසකි.

- ඉංග්‍රීසි නීතිය: අගනා ප්‍රතිෂ්ඨාව(Valuable Consideration)
- රෝම ලන්දේසි නීතිය: සාධාරණ හේතුව (Justa Causa).

# ප්‍රතිෂ්ඨාව

පුද්ගලයෙකු විසින් ගිවිසුමක් ඇති කරගැනීමේදී දෙනු ලබන පොරොන්දුවක් සඳහා ලබාදෙන්නා වූ යම් වටිනාකමක්.




## වලංගු ගිවිසුමක අත්‍යවශ්‍ය කොටසකි.

- ඉංග්‍රීසි නීතිය: අගනා ප්‍රතිෂ්ඨාව(Valuable Consideration)
- රෝම ලන්දේසි නීතිය: සාධාරණ හේතුව (Justa Causa).

**1. අගනා ප්‍රතිෂ්ඨාව**

මෙය ඉංග්‍රීසි නීතිය (English Law) යටතේ එන සංකල්පයකි. වලංගු ගිවිසුමක් ඇති වීමට නම් පාර්ශවයන් අතර යම් වටිනාකමකින් යුත් දෙයක් (මුදල්, භාණ්ඩ හෝ සේවාවන්) හුවමාරු විය යුතුය. ප්‍රතිෂ්ඨාවක් නොමැතිව ඇති කරගන්නා පොරොන්දු ඉංග්‍රීසි නීතිය යටතේ බලාත්මක කළ නොහැක.

# ප්‍රතිෂ්ඨාව

පුද්ගලයෙකු විසින් ගිවිසුමක් ඇති කරගැනීමේදී දෙනු ලබන පොරොන්දුවක් සඳහා ලබාදෙන්නා වූ යම් වටිනාකමක්.




## වලංගු ගිවිසුමක අත්‍යවශ්‍ය කොටසකි.

- ඉංග්‍රීසි නීතිය: අගනා ප්‍රතිෂ්ඨාව(Valuable Consideration)
- රෝම ලන්දේසි නීතිය: සාධාරණ හේතුව (Justa Causa).

**1. අගනා ප්‍රතිෂ්ඨාව**

මෙය ඉංග්‍රීසි නීතිය (English Law) යටතේ එන සංකල්පයකි. වලංගු ගිවිසුමක් ඇති වීමට නම් පාර්ශවයන් අතර යම් වටිනාකමකින් යුත් දෙයක් (මුදල්, භාණ්ඩ හෝ සේවාවන්) හුවමාරු විය යුතුය. ප්‍රතිෂ්ඨාවක් නොමැතිව ඇති කරගන්නා පොරොන්දු ඉංග්‍රීසි නීතිය යටතේ බලාත්මක කළ නොහැක.

**2. සාධාරණ හේතුව**

මෙය රෝම ලන්දේසි නීතිය (Roman-Dutch Law) යටතේ එන සංකල්පයකි. මෙහිදී ගිවිසුමක් වලංගු වීමට 'අගනා ප්‍රතිෂ්ඨාවක්' (මුදල්මය වටිනාකමක්) තිබීම අනිවාර්ය නොවේ. යම් පොරොන්දුවක් දීමට බලපෑ 'සාධාරණ හේතුවක්' තිබීම ප්‍රමාණවත්ය.

- උදාහරණයක් ලෙස, ආදරය, දයාව හෝ සදාචාරාත්මක බැඳීමක් මත යමෙකුට යමක් දීමට පොරොන්දු වීම රෝම ලන්දේසි නීතියේදී වලංගු ගිවිසුමකට පදනමක් විය හැකිය.

# Case Law
# ලිප්ටන් එදිරිව බියුකනන් (Lipton v Biuchanan)

සිදුවීම: ණය හිමියා තමාට ලැබිය යුතු ණය මුදල අය කර නොගන්නා බවට ණයකරුට පොරොන්දු විය.

• ගැටලුව: ණයකරු ඒ වෙනුවෙන් කිසිවක් ලබා නොදුන් නිසා, ඉංග්‍රීසි නීතියට අනුව එහි "අගනා ප්‍රතිෂ්ඨාවක්" (Valuable Consideration) නොතිබීම.

• තීන්දුව: ලංකාවේ ක්‍රියාත්මක රෝම ලන්දේසි නීතිය අනුව පොරොන්දුවක් වලංගු වීමට මුදල්මය වටිනාකමක් (ප්‍රතිෂ්ඨාවක්) අවශ්‍ය නැත. ඒ සඳහා "සාධාරණ හේතුවක්" තිබීම පමණක් ප්‍රමාණවත් බව මෙහිදී තීන්දු විය.

• ප්‍රතිඵලය: ණය හිමියාගේ පොරොන්දුව නීතිය ඉදිරියේ වලංගු විය.

# ප්‍රතිෂ්ඨා වර්ග

1. ඉටුකළ ප්‍රතිෂ්ඨාව
2. ඉටුකරන ලද ප්‍රතිෂ්ඨාව
3. අතීත ප්‍රතිෂ්ඨාව

# ප්‍රතිඥා වර්ග

- **ඉටු කළ ප්‍රතිඥාව** : දෙපාර්ශවයම අනාගතයේදී යමක් ඉටු කිරීමට පොරොන්දු වීම

උදා: භාණ්ඩ සැපයීම සහ පසුව මුදල් ගෙවීම

- **ඉටු කරන ලද ප්‍රතිඥාව** : එක් පාර්ශවයක් දැනටමත් තම පොරොන්දුව ඉටු කර අවසන්

උදා: නැතිවූ භාණ්ඩයක් සොයා දුන් පසු ත්‍යාග ලබා දීම.

- **අතීත ප්‍රතිඥාව** (Past): ගිවිසුමට පෙර කළ ක්‍රියාවක්. මෙය වලංගු නොවේ.

# නෛතික සබඳතාවයක් ඇති කර ගැනීමේ චේතනාව

- ගිවිසුමක් නීතිය ඉදිරියේ බලාත්මක වීමට නම් දෙපාර්ශවය අතර නීතියෙන් බැඳීමේ අදහසක් තිබිය යුතුය. මෙය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැක.
- 1. **ගෘහස්ථ එකඟතා** ගෘහස්ථ හා සමාජීය එකඟතා මෙහිදී නෛතික චේතනාවක් නැතැයි නීතිය උපකල්පනය කරයි

නඩුව: බැල්ෆර් එදිරිව බැල්ෆර් (Balfour v Balfour)

ස්වාමිපුරුෂයා විදේශගතව සිටියදී බිරිඳට මාසික දීමනාවක් එවීමට පොරොන්දු විය. පසුව ඔහු එය නතර කළේය. මෙය හුදෙක් පවුලේ අභ්‍යන්තර එකඟතාවයක් මිස නීතියෙන් බැඳීමේ අදහසින් කළ එකක් නොවන බැවින් බිරිඳට නඩු පැවරිය නොහැකි බව තීන්දු විය.

- 2. **වාණිජ හා ව්‍යාපාරික එකඟතා** මෙහිදී නීතියෙන් බැඳීමේ අදහසක් ඇති බව නීතිය පූර්ව නිගමනය කරයි.

# ගිවිසුමක ශක්නුතාවය

- සාමාන්‍යයෙන් සෑම පුද්ගලයෙකුම ගිවිසුමකට ඇතුළත් වීමේ නිදහසක් පවතී.. ඇතැම් පුද්ගලයන්ගේ නොහැකියාවන් අනුව නීතිය මඟින් ඔවුන් ආරක්ෂා කරන අතර ඔවුන් සම්පූර්ණ ගිවිසුම්ගත ශක්නුතාවය සහිතපුද්ගලයන් ලෙස නොසලකයි.

- බාලවයස්කරුවන්
- මානසික ආබාධ සහිත පුද්ගලයන්
- මත් වූ පුද්ගලයන්

# බාලවයස්කරුවන් යනු කවුද?

- ලංකාවේ නීතියට අනුව, වයස අවුරුදු 18 සම්පූර්ණ නොවූ ඕනෑම අයෙකු බාලවයස්කරුවෙකු ලෙස සැලකේ. මොවුන්ට ගිවිසුම්වලට එළඹීමේ පූර්ණ නීතිමය ශක්‍යතාවයක් නොමැත.

# බාලවයස්කරුවන් බැඳෙන ගිවිසුම් වර්ග

1. වලංගු ගිවිසුම

බාලවයස්කරුවෙකුගේ ජීවිතයට අත්‍යවශ්‍ය දේ ලබා ගැනීම සඳහා වන ගිවිසුම් වලංගු වේ. අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා: ආහාර, ඇඳුම් පැළඳුම්, නවාතැන් සහ අධ්‍යාපනය වැනි දේ මෙයට ඇතුළත් වේ. මෙහිදී ඔහු සාධාරණ මිලක් ගෙවීමට බැඳී සිටී.

2. ශූන්‍ය ගිවිසුම්

බාලවයස්කරුවෙකුට අහිතකර හෝ ඔහු සතු දේපළ පැවරීම වැනි ගනුදෙනු නීතිය ඉදිරියේ මුල සිටම ශූන්‍ය (වලංගු නොවන) වේ.

3. බල රහිත කළ හැකි ගිවිසුම්

බාලවයස්කරුට අවශ්‍ය නම් පමණක් වලංගු කරගත හැකි හෝ ප්‍රතික්ෂේප කළ හැකි ගිවිසුම් මෙයට ඇතුළත් වේ. විශේෂයෙන්ම ඔහු වයස 18 සම්පූර්ණ වූ පසු එම ගිවිසුම පිළිගැනීමට හෝ බැහැර කිරීමට හැකියාව ඇත.

# මත්පැන් පානය කළ අය

යම් පුද්ගලයෙකු ගිවිසුමකට එළඹෙන අවස්ථාවේදී, තමා එමගින් ඇති කරගන්නා නීතිමය බැඳීම හෝ ගිවිසුමේ ස්වභාවය තේරුම් ගැනීමට නොහැකි වන තරමට අධික ලෙස මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතා කර සිටී නම්, ඔහුට එම ගිවිසුම බල රහිත (Voidable) කළ හැකිය.

නමුත් මෙහිදී කොන්දේසි දෙකක් සම්පූර්ණ විය යුතුය

1. ඔහු ගිවිසුම තේරුම් ගැනීමට නොහැකි තරම් මත් වී සිටි බව ඔප්පු කළ යුතුය.
2. අනෙක් පාර්ශවය ඔහු මත් වී සිටින බව දැන සිටි බව ඔප්පු කළ යුතුය

# Thank you